**Hopper & Dosa Night**
**ආප්ප සහ තෝසේ රාත්‍රියක්**



ඩැන්ඩිනොන් ධම්මදීප භාවනා මධ්‍යස්ථානය විසින් පැකෙනම්හි ඉදිකිරීමට සැලසුම් කර ඇති නව විහාරස්ථානයට ආධාර පිණිස

ආප්ප සහ තෝසේ රාත්‍රියක්

*Hopper & Dosa Night*

2016 මාර්තු මස 05 වෙනි සෙනසුරාද

**Southern Community Centre**

No 27 , Rupert Drive ,Mulgrave .
Mel Way Ref – 80 F4

From 7.00 p.m. – 11.30 p.m.

Catering – Desha Catering
Music – Janaka Wijesekara

*Please take part in this event and contribute to a noble cause while enjoying with your friends.*

**Tickets - $ 20**

Contact : Kumari - 0408570438
Kumarage - 0418360615 Daya - 0425783028



සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්



# මහින්දලාට අලුත් පක්ෂයක් හදා ගන්න ඉඩ දෙන්න

**අජිත් පැරකුම් ජයසිංහ**

මහින්ද, ගෝඨාභය, බැසිල්, විමල්, උදය, දිනේෂ්, වෙල්ගම, රෝහිත අබේගුණවර්ධන, වාසුදේව, ඩලස්, බන්දුල ආදීහු එක්ව ශ්‍රීලනිපය කඩා අලුත් පක්ෂයක් පිහිටුවන්නට යන බවට මේ දිනවල ලොකු ටෝක් දෙමින් සිටිති.

**මෙම පිරිස වෙන ම ගොනු වීම ඇත්තෙන් ම රටට කරන ලොකු සෙතකි. නම් වැල කියවූ පමණින් ම මොවුන් කවුරු ද යන්න පැහැදිලි ය. සරළව කිව්වොත්, මේ වනාහි පසුගිය අඳුරු දශකය තුළ මහජන මුදල් කාබාසිනියා කිරීමට නායකත්වය දුන් සොරමුල බව නො දන්නේ කවුරු ද?**

ඔවුන් පසුපසින් යන පළාත් සභා, පළාත් පාලන මන්ත්‍රී කැලත යනු ඔවුන්ගේ චෞර සහායකයෝ ය. නිදසුනක් ලෙස, කුමාර් වෙල්ගම පසුපසින් යන අයෙකු වන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති උදේනි අතුකෝරල යනු බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිගෙන් අල්ලසක් ගන්නට යද්දී අතට ම හසු වූ නඩු පමා වීම නිසා ඇප පිට සිටින අයෙකි. මේ අය වනාහි ජනප්‍රිය පිරිසක් නො වේ. ඔවුන් ප්‍රසිද්ධ ය. වඩා නිවැරදිව කියනවා නම් කුප්‍රකට ය. එසේ ම සොරකම් කරන ලද මුදල් හා රාජ්‍ය බලය තුළ බලවත් ය. රාජ්‍ය බලය නැති වූ විට ඔවුන්ගේ දක්ෂකම් බලාගන්නට පුළුවන.

මේ සියල්ලන්ට ම නඩු ඇත. ඒ නඩු සාධාරණව විභාග වුවහොත් මේ සියල්ලන් ම සිටිය යුත්තේ හිරේ ය. ඒ නිසා එය වළක්වා ගැනීමට වා නා වා පෝ නා පෝ ගේමක් දෙන්නට ඔවුන් පෙරට පැමිණ තිබේ. අප එය තේරුම් ගත යුතු ය.

ඔවුන් අලුත් පක්ෂ හදන්නට යන මොහොත ද නල්ල මලේ එකකි. ඒ වනාහි ජාතික මට්ටමෙන් ලොකු බලපෑමක් කළ නො හැකි පළාත් පාලන ඡන්දය ඉදිරියේ ය. ඔවුන්ට කිව යුතුව ඇත්තේ ඔහොම යං කියා ය.

ශ්‍රීලනිපය පැත්තෙන් ගත් කල මෙම පිරිස ඉවත් ව යාම පක්ෂයට දැවැන්ත ආශිර්වාදයක් කර ගත හැකි ය. පක්ෂය අත්පත් කරගෙන සිටින මේ බහිරවයන් පිරිස ඉවත් වී යාමත් සමග පක්ෂයට අලුත්, ප්‍රජාතන්ත්‍රවාදී, දක්ෂ හා පිරිසිදු දේශපාලන බලවේගයක් ආකර්ශනය කර ගැනීමේ අවස්ථාව විවෘත වේ.

මෙවැනි අලුත් පක්ෂ ඡන්දයකදී දෙකකදී සෙල්ලම් දමනු ඇත. ඒ සඳහා පළාත් පාලන ඡන්දයක් හොඳට ම ඇති ය. අතීතයේදී ලලිත් ඇතුලත්මුදලි * ගාමිනී දිසානායක ඩබල විසින් බිහි කරන ලද තුන්වන බලවේගය හා මෑතදී සරත් ෆොන්සේකාට වූ දෙය අත්දැකීම් ලෙස ගත හැකි ය. ජවිපෙන් ලොකු ම කෑල්ලක් කැඩී ගියත් ජවිපෙට දිගු කාලීනව අභියෝග කිරීමට පෙසපට බැරි වීම තවත් උදාහරණයකි.

මෛත්‍රීපාල ළ නො බලා දුර බැලිය යුතු ය. මොවුන්ට කඩාගෙන යනවා ය කියා පක්ෂය බ්ලැක්මේල් කිරීමට ඉඩ නො දිය යුතු ය. ඒ වෙනුවට කඩාගෙන පලයව් යි කියන්නට ආත්ම ශක්තිය ඔහුට තිබිය යුතු ය. තාවකාලික පසුබෑස්මක් ඇති විය හැකි මුත්, අලුත් පිරිසක් සමග අලුත් ජවයකින් පටන් ගන්නට එය අවස්ථාවකි.

අනෙක් පැත්තෙන්, මෙම බලවේගයේ ප්‍රචණ්ඩත්වයේ තරම වටහාගෙන ඒ අනුව කටයුතු කිරීමට ද වග බලා ගත යුතු ය.

---

**35 වන පිටෙන්**

පුද්ගලයාත් දෙදෙනෙකු විනා එක් අයකු නොවෙන බව හිතන්න අසාර්ථක උත්සාහයක් දරමින් මං වලාකුලින් තොර වියළි අහස දිහා බලං හිටියා.

ජනේලය තුලින් කාමරයට බලෙන් වැදුණු හිතුවක්කාර හුලං රැල්ලක් මේසය මත තිබුණු කඩදාසියක් පා කරලා හැරියා. මං නිරායාසයෙන්ම ඒ කොලේ අල්ල ගත්තා ඈතට යන්න නොදී. ඒ කඩදාසිය හිස් කඩදාසියක් නොවේ. යමෙකුගෙ ආත්මය කැටයම් කරපු , හෘද සාක්ෂියක් තරමටම නිකැලැල් ලියවිල්ලක් ඒක. සසංකගෙ ලස්සන අත් අකුරින් ලියපු කවියක් ඒ කොළේ තිබුණා.

ඈත වංගුවෙන් මතුවී
රියක් එනවා පෙනේ
කඳු නැගුණු දූලි රැලි
බිඳුණු මීට් තාප්පෙන්
මෙපැත්තට පාව ඒ

දිරාගිය ගේට්ටුව
විවර වන බොල් හඬක්
ඇසෙන තුරු කන් යොමමී
යළිත් ඇඳ මත වැටෙමී. වකුටුවෙමී.

රථය නැවතී නැත
ගේට්ටුව තවමත් නිහඬය
විවරත් ඇගෙ නොවේ
වංගුවෙන් මතුව ආ මොටෝරිය

රෑ පිපුණු සේපාලිකා මල්
වියළි සුළඟව හසුව
ජනෙල් කණ්ඩිය මතට අතහැරේ නොපිටට
මමත් ඒ මලක් වෙමී
මඳකුදු සුවඳ නැති
පරව යනු පිණිසම සුපිපුණු

මගේ උගුර හිර වෙන බ වමට දැනුණා. මං කඩදාසිය මේසෙ මත පරිස්සමට තියලා පිටතට එන්න හැරුණා.

"ඉඳුවර අයියෙ"
සසංකගෙ කටහඬ මාව එතැනම නතර කෙරුවා.

"අයියට කවදහරි කොහෙදි හරි දූලිනි ව හම්-බවුණොත් ඔය කවිය එයාට දෙනවද"

එවෙලෙ තමා මං සෘජුව සසංක දිහා බැලුවෙ. මං එකපාරටම දැක්කෙ ගැටඹෙ බාප්පා ඇඳේ හාන්-සිවෙලා මං දිහා බලං ඉන්නවා වගේ. මුහුණ පුරාම වැඩුණු රැවුල්කොට ගිලන්ව හේබා ගිය මුහුණට මහා පාළුවක් එක්කරලා තිබුණා. සුදු මේස් බැණ-යමට යටින් , කෘෂව ගිය ලය වේගයෙන් ඉහළ පහළ යන අන්දම මට පෙනුණා. මං වේගයෙන් ඉවතට ආවෙ මගේ පුරුෂ ආත්මයටවත් ඒ තරං වේදනාවක් උහුලගන්න බැරි නිසා. අපේ අම්මගෙ හුස්ම යට ඉඳන් ජීවිතය කියවන්න පුරුදු වුණු ආර්තී මේ වේදනාව කොහොම උහුලයිද කියලා මගේ යටි හිත මට මතක් කරන්න ගත්තා. සසංක අවසානයේ ගැටඹෙ බාප්පාගෙ ප්‍රතිබිම්බයක් වෙලා ජීවිතයෙන් සමුගන්න බව කටුක යථාර්තයක් බවට පත්වෙමින් තිබුණා.

ඒ යථාර්තය ඇතුලෙ මංගලී මොනතරං අසරණද කියලා මං කල්පනා කළා. අපි කවුරුවත් කවදාවත් ඇහුම්කන් නොදුන්න මංගලී පමණක් දන්න එයාගෙ කතාව මොන තරං සංකීර්ණ ඇතිද කියලා අමුතුවෙන් මට හිතෙන්න ගත්තා. අපි සසංකව බලන්න ගිහින් ඇවිත් දවස් තුනකට පස්සෙ දැනගන්න ලැබුණා සසංක සදහටම ඇස් පියාගත්ත

බව. ආර්තී මහ හයියෙන් කෑ ගහලා ඇඬුවා. නිල්හාන් එයාව වැරෙන් පපුවට තුරුළු කරන් හි-ටියා ඇති තරං අඬන්න කියලා. මගෙ නංගි ආර්තී එදා ඇඬුවෙ එයාට මාස තුන පිරෙන්න කලින් සොල්දරේ එල්ලිලා මැරුණු එයාගෙ අම්මත් පස්සෙ කාලෙක අකාලෙ මැරුණු එයාගෙ තාත්තත් මල්ලිත් යන තුන් දෙනාම වෙනුවෙන් කියලා මං එදා තේරුං ගත්තා.

**මතු සම්බන්ධයි**